ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය - 2023

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ ("මණ්ඩලය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශ
i)	ඔප්පු හිමියන්ගේ ප්‍රධාන තොරතුරු ඇතුලත් ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් මණ්ඩලය සතුව නොමැත. එම නිසා හිමිකම් ඉල්ලීමේ අයදුම්පත්‍ර භාර ගැනීමේදී අක්‍රමිකතා ඇතිවීම, හිමිකම් ඉල්ලීමේ තොරතුරු නැතිවීම, හිමිකම් ඉල්ලීමේ අයදුම්පත්‍රවල දෝෂ නිවැරදි කිරීමේ ප්‍රමාදයන් ඇතිවීම සහ හිමිකම් ලබාදීමේ ක්‍රියා පටිපාටියෙහි අනවශ්‍ය ප්‍රමාදවීම් ඇතිවීම සිදුවේ. 2025 පෙබරවාරි 28 දින වන විට රාජ්‍ය සේවකයන්ගේ අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සහ විශ්‍රාමිකයන්ගේ අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ මුළු සාමාජික සංඛ්‍යාව 1,362,886 ක් විය. කෙසේවෙතත්, ඔප්පුහිමියන් අතරින් මුළු ප්‍රතිලාභින් ප්‍රමාණය 2025 මැයි 30 වන විට සංඛ්‍යාත්මකව ප්‍රකාශ කිරීමට මණ්ඩලය අපොහොසත් විය.	2025 මාර්තු 31 වන විට, අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා රාජ්‍ය නිලධාරීන් 936,600 ක් දායකවී ඇත, නමුත් NITF වෙබ් අඩවියට ලියාපදිංචි වී ඇත්තේ ඉන් 361,424 දෙනෙක් පමණක් වන අතර 244,626 ක් පමණක් සත්‍යාපනය වී ඇත. බලාපොරොත්තු වූ පරිදි රාජ්‍ය ආයතන තම සේවකයන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම හෝ තහවුරු කිරීම සිදුකර නැත. මෙයට විසඳුමක් ලෙස NITF ආයතනය සාමාජිකයන්ගේ තොරතුරු සනාථ කර ගැනීම සඳහා වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට ඇතුළු වීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම ඒකාබද්ධ වීම සඳහා පද්ධතිය යාවත්කාලීන කිරීම බොහෝදුරට අවසන් වෙමින් පවතින බැවින් 2025 ජුනි 30 වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වේ.	දත්ත වල නිරවද්‍යතාවය සහ වලංගු බව වැඩි දියුණු කිරීම සඳහා අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සම්බන්ධව ඒකාබද්ධ පද්ධතියක් පිහිටුවා පවත්වාගෙන යෑම සඳහා මණ්ඩලය කටයුතු කළ යුතුය

		මෙම සංක්‍රමණය වීමෙහි අරමුණ දත්තවල නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම සහ ප්‍රවහගත කිරීම සනාථ කිරීම වේ.	
ii)	2023 දෙසැම්බර් 31 දින වනවිට ප්‍රතිරක්ෂණ අවසන් නොවූ හිමිකම් සඳහා සලස්වා ඇති ප්‍රතිපාදන මුදල රු. 3,233,733,923 ක් (2024 දෙසැම්බර් 31 දින වනවිට රු. 3,248,073,982 ක් සහ 2025 අප්‍රේල් 30 දින වනවිට රු. 5,616,058,199 ක් — 2016 සහ 2017 ගංවතුරසඳහා ගෙවිය යුතු හිමිකම් හැර ලෙස) විය. අදාළ සමාලෝචනයට ලක්වන වර්ෂය තුළ ගෙවා ඇති ප්‍රතිරක්ෂණ හිමිකම් රු. 192,372,895 ක් සහ ඩොලර් 12,387 ක් (2024 දෙසැම්බර් 31 දින වනවිට රු. 308,363,311 ක් සහ ඩොලර් 403,050 ක්, 2025 ජනවාරි සිට අප්‍රේල් දක්වා රු. 66,491,858 ක් සහ ඩොලර් 221,855 ක්) විය. කෙසේ වෙතත්, ප්‍රතිරක්ෂණ හිමිකම් Excel පත්‍රිකා භාවිතයෙන් අතින් පමණක් සටහන් තැබීම සිදුකර ඇත. එනිසා, ප්‍රතිරක්ෂණ හිමිකම් කළමනාකරණය සඳහා නිසි පද්ධතියක් නොමැති බව නිරීක්ෂණය කෙරිණි.	ප්‍රතිරක්ෂණ අංශය විසින් 2024 වර්ෂයෙන් ආරම්භ කරමින් ප්‍රතිරක්ෂණ හිමිකම් කළමනාකරණය කිරීම සඳහා ඔරකල් හිමිකම් පද්ධතිය යොදා ගැනීමට පියවර ගෙන ඇත. ඒ අනුව, මෙම ඔරකල් පද්ධතිය හිමිකම් දැනුම් දීමේ අදියරේ සිට හිමිකම් අනුමත කිරීමේ අදියර දක්වා සම්පූර්ණ ක්‍රියාවලිය හසුරුවයි. තවද, හිමිකම් සහතික කිරීමේ අදියරේ සිට අනුමත කිරීමේ අදියර දක්වා සියලුම හිමිකම්, මූල්‍ය අධිකාරියේ පැවරීමේ මට්ටම්වලට අනුව සමීප අධීක්ෂණය සහ පාලනය යටතේ සිදු කෙරේ.ඔරකල් හිමිකම් පද්ධතිය හරහා ඍජුවම හිමිකම් වාර්තා ජනනය කිරීමට හැකි වන පරිදි වත්මන් ඔරකල් පද්ධතිය තවදුරටත් සංවර්ධනය වෙමින් පවතී.තවදුරටත් ,තොරතුරු තාක්ෂණ උපදේශකයෙකුගේ සහයදීම යටතේ ERP පද්ධතිය ඔස්සේ හිමිකම් පද්ධතිය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ද සම්පාදනය වෙමින් පවතී.	ප්‍රතිරක්ෂණ හිමිකම් නිවැරදි, කාලෝචිත සහ ක්‍රමානුකූලව හැසිරවීම සහතික කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රතිරක්ෂණ හිමිකම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය.
iii)	2023 ජනවාරි 31 දින අවසන් වූ ප්‍රතිප්‍රතිරක්ෂණ ආවරණයෙන් පසු මණ්ඩලය විසින් තමන්ගේම අවදානම් නිරාවරණය ආවරණය කිරීම සඳහා අවශ්‍ය 30% අනිවාර්ය ප්‍රතිරක්ෂණ ආවරණය ලබාගෙන නොමැත. මෙය මණ්ඩලයට අලාභ දරාගැනීමේ හැකියාව අඩු කරන අතර විශේෂිත කලාපයන්හි අලාභවලට වැඩි අවදානම්කාරී බවට පත් කරයි. මෙය මණ්ඩලයේ සමස්ත අවදානම් පැතිකඩ වැඩිදියුණු කිරීමට හේතු වන අතර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ණය ශ්‍රේණිය පහත දැමීමටද සාධාරණව බලපානු ඇත. සමස්ත වශයෙන්, ප්‍රතිප්‍රතිරක්ෂණ ආවරණ නොමැතිවීම මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ ස්ථායීත්වය දැඩි ලෙස දුර්වල කිරීමට	2023.01.31 සිට ජාතික රක්ෂණ අරමුදල විසින් ජාත්‍යන්තර තරඟාත්මක ලංසු ක්‍රියාවලිය (ICB) මගින් ප්‍රතිප්‍රතිරක්ෂණ ආවරණය ලබාගැනීම සඳහා උත්සාහ දැරූ අවස්ථා 05ක් තිබුණද, ලංසු නොලැබීම, අනුකූලතාව නොමැතිවීම හෝ ලංසුකරුවන් තරඟයෙන් අස්වීම ආදී හේතු මත සියල්ල අසාර්ථක විය. වර්තමාන ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැනට ක්‍රියාත්මක වෙමින්, ලංසු ඇගයීම් කමිටුව (BEC) ද කැඳවා ඇත. සාමාන්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලීන් ප්‍රතිරක්ෂණයේ විශේෂිත ස්වභාවය සමග ගැළපීමේ අභියෝග මත, ජාතික රක්ෂණ අරමුදල විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව (NPC) සහ අදාළ ආයතනික අමාත්‍යාංශය සමග සාකච්ඡා කරමින් සකස් කරන ලද ප්‍රසම්පාදන රාමුවක් සංවර්ධනය කරමින්	ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව (NPC) සහ අදාළ ආයතනික අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරමින් ප්‍රතිරක්ෂණ සහ ප්‍රතිප්‍රතිරක්ෂණ ගිවිසුම් සඳහා විශේෂිත ප්‍රසම්පාදන රාමුවක් සකස් කර ක්‍රියාත්මක කිරීම මණ්ඩලය ඉක්මනින් ඉටු කළ යුතුය.

හැකි අතර එය ශ්‍රී ලංකාවේ රක්ෂණ වෙළඳපොළටද බලපෑම් සිදු කළ හැක. මණ්ඩලය විසින් ප්‍රතිරක්ෂණ ආවරණය ලබාගත නොහැකිවීමේ හේතුව වන්නේ අතීතයේ ප්‍රතිරක්ෂණ වාරික සහ හිමිකම් ගෙවීම් සිදු කිරීමේ දුර්වල කාර්යසාධනයයි. එම හේතුව මත Fitch Ratings Lanka Limited ආයතනය විසින් මණ්ඩලයේ ණය ශ්‍රේණිය 2023 අගෝස්තු මාසයේදී A– සිට BBB+ දක්වාද, 2023 ඔක්තෝබර් මාසයේදී BBB+ සිට BBB දක්වාද අවම කර ඇත2025 පෙබරවාරි මාසය දක්වා ණය ශ්‍රේණිය BBB ලෙස පවතී. එසේම, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් 2024 ජූලි 18 වන දින IRCSL/DG/SUP/2024/07/236 අංක ලිපිය මගින් මණ්ඩලය වෙත උපදෙස් දී ඇත. එනම්, IRCSL වෙත ගැලපෙන පරිදි සහතික කර ඇති තරමට ප්‍රමාණවත් නැවත රක්ෂණ (retrocession) පිවිසුම් සකස් කරන තුරු, මණ්ඩලය විසින් ආදේශක ප්‍රතිරක්ෂණයෙන් (facultative reinsurance) 30% දක්වා පිළිගැනීම නවතා දැමිය යුතුයයි. එම නිසා, මෙය මණ්ඩලයේ රක්ෂණ අවදානම් කළමනාකරණය හා මුදල් ප්‍රවාහ කළමනාකරණය සඳහා අහිතකර බලපෑමක් සිදු කරනු ඇත.	පවතී. මෙම නව යාන්ත්‍රණය සැලසුම් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. ප්‍රතිරක්ෂණ ආවරණ නොමැතිවීම සහ රටේ ණය ශ්‍රේණිගත කිරීම් පහත දැමීම ජාතික රක්ෂණ අරමුදලේ ණය ධාරිතාවට අහිතකර බලපෑම් සිදුකර ඇත.කෙසේ වෙතත්, ශ්‍රේණිගත කිරීමේ සමාලෝචනයකින් පසු 2024 දෙසැම්බර් මාසයේදී වැඩ වර්ජනය සඳහා ප්‍රතිරක්ෂණ ගිවිසුමක්. කැරලි, සිවිල්, කැලඹීම් සහ ත්‍රස්තවාදී (SRCC) අරමුදල සාර්ථකව සුරක්ෂිත කරන ලදී.

1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශ
LKAS 12 ට අනුව, නිශ්චිත නිදහස් කිරීමක් අදාළ නොවන විට, සියලු බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා වත්කම්/වගකීම් හඳුනාගත යුතුය. සමාලෝචනයට භාජනය වන වර්ෂය සඳහා කල් දැමූ බදු ගණනය කිරීම සඳහා මණ්ඩලය විසින් භාවිත කිරීමේ අයිතිය වත්කම් සහ අස්පෘශ්‍ය වත්කම් සලකා බලා නොතිබුණි.	අනාගත ඉදිරිපත් කිරීම් වලදී මණ්ඩලය විසින් අස්පෘශ්‍ය වත්කම් සහ භාවිත කිරීමේ අයිතිය පිළිබඳ වත්කම් සලකා බලනු ඇත.	මණ්ඩලයේ විලම්බිත බදු වත්කම් හෝ වගකීම් ගණනය කිරීමේදී අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීමේ අවශ්‍යතාවය.

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශ
i)	රු.19,993,473 ක මුදලක් ප්‍රතිරක්ෂණ ලබාගත යුතු මුදල් (NNIDS) ලෙස සටහන් කර ඇති අතර, එය වසර 5කට වැඩි කාලයක් වෙනස් නොවී පවතිනු ඇති අතර, ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල සාධාරණ ප්‍රතිපාදන සිදු කර නොමැත	එකග වෙමි.	ප්‍රතිරක්ෂණ ලබාගත හැකි බව පිළිබඳ සවිස්තරාත්මක ඇගැයීමක් සිදු කිරීමෙන් පසු, මණ්ඩලය විසින් දිගුකාලීනව පවතින ප්‍රතිරක්ෂණ ලබාගත යුතු ශේෂය සඳහා ප්‍රමාණවත් වෙන්කිරීමක් සිදු කළ යුතුය.
ii)	රු. 521,287,319 ක ප්‍රතිරක්ෂණ හිමිකම් ගෙවිය යුතු මුදල, රු. 251,742,612 පිලිවෙලින් 2016 හා 2017 වසරේ ද වෙනස් නොවී පවතින බව නිරීක්ෂණය විය. මෙම ගෙවීම් සිදු කිරීමට ඇති බැඳීම් තවදුරටත් පවතිනවාද යන්න තහවුරු කර නොමැත.	2024.08.26 සහ 2024.09.25 දින සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත 2020 පෙර හිමිකම් සඳහා හිමිකම් අරක්ෂිත මුදල් තහවුරු කිරීම 2024.10.07 වන විට සිදු කරන ලෙස ලිපි යවා තිබේ. සමහර සමාගම් එයට පිළිපැද සිටියද, අනෙක් සමාගම් තම දත්ත ඉදිරිපත් කර නොමැත.ඉදිරිපත් කළ තොරතුරු මත පදනම්ව, අතිරික්ත අරක්ෂිත මුදල් ඉවත් කිරීම සඳහා මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. එමගින්, 2016 සහ 2017 ගංවතුරහිමිකම් සඳහා වූ අරක්ෂිත මුදල් රු. 491,424,871 කින් අඩු කරනු ලබන අතර, අතිරික්ත අරක්ෂිත මුදල් යාවත්කාලීන කිරීම හා ඉවත් කිරීමේ ක්‍රියාවලිය ද මේ වන විට සිදු කෙරේ.	ප්‍රතිරක්ෂණ හිමිකම් ගෙවිය යුතු ශේෂයන් සම්බන්ධයෙන් තහවුරු කිරීම් සිදු කර, නියමිත කාලෝචිතව මූල්‍ය ප්‍රකාශනවලදී යාවත්කාලීන කිරීම් සිදු කර නිවැරදි බැඳීම් පෙන්විය යුතුය.
iii)	රු. 1,417,548,336 ක මුදලක් ප්‍රතිරක්ෂණ ලබාගත යුතු මුදල් ලෙස සටහන් කර ඇති අතර, එයින් රු. 833,899,635 හෝ සියයට 58ක් මූල්‍ය ප්‍රකාශන වලදී සමාලෝචිත වර්ෂයට අදාලව හානි ප්‍රතිපාදනය ලෙස වෙන්කර ඇත. කෙසේ වෙතත්, ඉතිරි රු.	ප්‍රතිරක්ෂණ ආපසු රක්ෂණය යටතේ ලබාගත යුතු ප්‍රතිරක්ෂණ මුදල් පිළිබඳව මණ්ඩලය, ප්‍රතිරක්ෂණ තැරව්කරුවෙකු (Strategic Insurance Brokers Private Ltd.) වෙතින් විද්‍යුත් තැපැල් තහවුරු කිරීමක්	අලාභ වෙන්කිරීම් විශ්වාසනීය හා සනාථ කළ හැකි සාධක මත පදනම්ව සිදු වන බව සහතික කිරීම සඳහා, මණ්ඩලය විසින් ප්‍රතිරක්ෂණ ලබාගත යුතු

	583,648,701 ක ශේෂය ලබාගත හැකි බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොමැත.	ලබාගෙන ඇත, “Omega Line” ප්‍රතිරක්ෂණ ප්‍රතිසාධනය සම්බන්ධයෙන් Omega Line ප්‍රතිරක්ෂණ යටතේ ලැබීමට නියමිතය.ඉහත සඳහන් හිමිකම ප්‍රතිසාධනය කිරීම සම්බන්ධයෙන් තැරව්කරු කොන්දේසියක් පනවා ඇත. එමනිසා, විශේෂිත වෙන්කිරීමක් සඳහා තිබූ නිරපේක්ෂ සාධක මත පදනම්ව ආපසු රක්ෂණය සඳහා හානි ප්‍රතිපාදනය සිදු කර ඇත. අමතරව, ඉතිරි මුදල ප්‍රතිසාධනය නොවීම පිළිබඳ සාක්ෂි නොමැති බැවින්, ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදු කර නොමැත.	මුදල් සම්බන්ධ ඇගයීම් සහ ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතුය.
iv)	2022 වසර සිට කොමිස් මුදල ලෙස ගෙවිය යුතු රු. 149,768,140 ක් සහ ගිණුම් හා ප්‍රතිරක්ෂණදෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු රු. 22,465,243 ක් යන මුදල් වෙනස් නොවී පවතින බව නිරීක්ෂණයවිය. තවද, ගිණුම් හා ප්‍රතිරක්ෂණදෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු ශේෂය අන්තර දෙපාර්තමේන්තු ශේෂයක් වන අතර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී එය බැහැර කළ යුතු වේ.	අධ්‍යක්ෂ මණ්ඩලය 2022 වසර සඳහා හිමි ලාභ 2025 වසරේදී ගෙවීමට තීරණය කළේය. ඒ අනුව, 2025 වසරේදී ගෙවිය යුතු ලාභ කොමිස් මුදල ගෙවා අවසන් කර ඇත. තවද, මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු රු. 22,465,243 ක් අන්තර් දෙපාර්තමේන්තු ශේෂයක් වන අතර එය 2025 වසරේදී සම්පූර්ණයෙන් නිරවුල් කිරීමට නියමිතය.	මණ්ඩලය නියමිත කාලෝචිතව ඉතිරි ගෙවීම් සමාලෝචනය කර, ගිණුම් ගලපා, නිරවුල් කිරීමේ කටයුතු සිදු කළ යුතු අතර, විශේෂයෙන්ම දිගු කාලයක සිට ගෙවිය නොහැකිව පවතින ගෙවීම් සහ අන්තර් දෙපාර්තමේන්තු ගෙවීම් පිළිබඳව සැලකිල්ල යොමු කළ යුතුය.
v)	මණ්ඩලය රු. 8,519,231 ක මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්තා කර ඇති අතර, එම සම්පත් අවුරුදු 2 සිට 5 දක්වා කාලය තුළ වෙනස්කම් සහ තහවුරු කිරීම් නොමැතිව පවතින බව දක්නට ලැබේ කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් සාධාරණ ප්‍රතිපාදන වෙන් කිරීමක් කර නොමැත.	රු. 8,519,231 කට සමාන මූල්‍ය නොවන වත්කම් ශේෂය, පෙර වසරවලින් ඉදිරියට ගෙන ආ දිගු කාලීන ඉතිරි ශේෂයන්ගෙන් සමන්විත වේ. මෙම ශේෂයන් නිරවුල් කිරීම හා ප්‍රතිපාදන වෙන් කිරීමක් සඳහා අවශ්‍ය පියවර ඉදිරියේදී ගන්නා බව අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රකාශ කර ඇත.	දිගු කාලය තුළ ඉතිරිව පවතින මූල්‍ය නොවන වත්කම් ආපසු ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් කළ යුතු අතර, එයට අදාළව අවශ්‍ය හානි ප්‍රතිපාදනය සිදු කල යුතුය.

1.6 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකුල නොවීම

නීති,රීති හා රෙගුලාසි ආදියට යොමුව	අනුකුල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශ
අංක 2/2022 සහ 2022 ජනවාරි 18 දින දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4 වන ඡේදය	චක්‍රලේඛයේ නියමයන්ට අනුව ජංගම දුරකථන මිලදී ගැනීමේ වියදම පුද්ගලිකව නිලධාරීන් විසින් භාරගත යුතුය. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩලය 2023 වසරේදී සේවකයින් තිදෙනෙකු (03) ට ජංගම දුරකථන මිලදී ගැනීම සඳහා රු. 253,000 ක වියදමක් සිදුකර ඇත. තවද, 2016 සිට 2023 කාලය තුළ ජංගම දුරකථන මිලදී ගැනීම සඳහා රු. 3,074,071 ක මුළු වියදමක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකර ඇත. එසේම, මේ සම්බන්ධයෙන් භාරදීම සහ භාරගැනීම සඳහා සුදුසු තොග සහ ලේඛන ගත කිරීමේ ක්‍රියාවලිය පවත්වා නොගත් බව ද නිරීක්ෂණය විය.	අධ්‍යක්ෂ මණ්ඩලය 2020 අගෝස්තු 18 දින (තීරණය 165-04) ව්‍යාපාර මෙහෙයුම් සඳහා සහායක්ලෙසට කාර්ය මණ්ඩලයට නිල ජංගම දුරකථන ලබාදීම සඳහා ප්‍රතිපාදන අනුමත කළේය. කෙසේ වෙතත්, 2023 පෙබරවාරි 10 දින විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් අනුව එම පහසුකම අත්හිටුවන ලදී. ජංගම දුරකථන නිකුත් කිරීම හා ආපසු ලබා ගැනීම සඳහා තොග සහ ලේඛන ගත කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වන අතර, සේවයෙන් ඉවත්වන සේවකයින් සඳහා අනිවාර්ය අවසරපත්‍රය හඳුන්වා දීම මගින් එය තවදුරටත් වැඩිදියුණු කර ඇත.	අදාළ චක්‍රලේඛයේ උපදෙස් වලට අනුකූලව ක්‍රියා කිරීම නිර්දේශ කෙරේ.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිපලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිපලය රු. 6,545,895,266ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 6,835,723,619ක් විය. ඒ අනුව ඌනතාවය රු. 289,828,353ක මූල්‍ය ප්‍රතිපලයක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට හේතුව සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ එකතු කරන ලද දළ ලිඛිත වාරික සහ බෝග රක්ෂණ බද්ද අඩුවීමයි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අංශ වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචනා කරන ලද වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අංශ, පෙර වර්ෂය සමඟ සංසන්දනය කරමින්, වැඩිවීම හෝ අඩුවීම සඳහා ප්‍රතිශතය සමග පහත දැක්වෙයි.

අදාල අයිතමය	**2023** රු.	**2022** රු.	විචලනය රු.	විචලනය %	වෙනස්කමේ හේතුව
ආදායම					
මෘදු ණය මත පොලිය	144,229	1,955	142,275	7278	මෘදු ණය නිරවුල් කිරීමේ වැඩිවීම
කල්පිරිම දක්වා තබාගත් ආයෝජන මත පොලී ආදායම	42,267,223	71,806,844	(29,539,621)	(41)	2023 වර්ෂය තුළ SLDB ආයෝජනවල කල්පිරිම.
වෙනත් ආදායම්	178,231,424	1,369,925,753	(1,191,694,329)	(87)	2023 වර්ෂය තුළ විනිමය පාඩු සිදුවීම හේතුවෙන්.
දළ ලිඛිත වාරික	11,402,441,499	12,201,341,213	(798,899,714)	(7)	2023 වර්ෂය තුළ ප්‍රතිරක්ෂණ වාරිකයේ අඩුවීම.
බෝග රක්ෂණ බද්ද එකතු කරන ලදී	2,441,408,966	2,572,862,779	(131,453,813)	(5)	අදාළ සාමාජික ආයතනවල ලාභයේ අඩුවීම.
වියදම					
SSCL **වියදම**	221,957,913	17,884,044	204,073,869	1141	අග්‍රහාරයේ SSCL හි වැඩිවීමක්
වාරික ලැබිය යුතු හානිය	148,315,734	12,054,127	136,261,608	1130	ලැබිය යුතු වාරික සඳහා අතිරේක හානිපූරණ ප්‍රතිපාදනයක් ලබා දීම.
ප්‍රතිරක්ෂණ ලැබිය යුතු හානිය	863,896,464	-	863,896,464	100%	ප්‍රතිරක්ෂණ සඳහා හානි අවම කිරීමේ ප්‍රතිපාදනයක් ලබා දීම. 2023 වර්ෂය තුළ ලැබිය යුතු ශේෂය.

2.3 අනුපාත විශ්ලේෂණය

පෙර වසර හා සසඳන විට මණ්ඩලයේ ප්‍රධාන අනුපාත පහත දැක්වේ.

විස්තරය	2023	2022
	%	%
දළ ලාභ ආන්තිකය	97.4	99.9
මෙහෙයුම් ලාභ ආන්තිකය	59.3	41.0
ශුද්ධ ලාභ ආන්තිකය	37.0	33.0
සේවයේ යොදවා ඇති ප්‍රාග්ධන ප්‍රතිලාභය	21.0	44.0
හිමිකම් මත ප්‍රතිලාභය	29.0	35.0
මුළු වත්කම් පිරිවැටුම	40.0	50.0

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතාවය

විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශ
ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද සංඛ්‍යාන අත් පොත - 2022 ට අනුව, අර්ධ රාජ්‍ය සේවකයින්ගේ මුළු සංඛ්‍යාව 2023 දී ආසන්න වශයෙන් 240,000 ක් සහ 2024 දී 217,255 ක් විය. ඊට පටහැනිව, අග්‍රහාර අර්ධ රාජ්‍ය යෝජනා ක්‍රමය යටතේ 2023 දී සේවකයින් 40,000 ක් සහ 2024 දී 30,700 ක් පමණ බඳවා ගන්නා ලදී. මෙයින් පෙනී යන්නේ සුදුසුකම් ලත් අර්ධ රාජ්‍ය සේවකයින් 200,000 කට වැඩි පිරිසක් මෙම යෝජනා ක්‍රමයේ ආවරණයෙන් පිටත සිටින බවයි.ව්‍යුහගත සහ ක්‍රියාශීලී බඳවා ගැනීමේ යාන්ත්‍රණයක් නොමැතිකම, මණ්ඩලයට තම වෙළඳපොළ පදනම පුළුල් කිරීමට, වාරික ආදායම වැඩි කිරීමට සහ අර්ධ රාජ්‍ය අංශය තුළ තම පැවැත්ම ශක්තිමත් කිරීමට ඇති අවස්ථාව මග හැරී යයි.	2018 දී අනිවාර්ය නොවන වැඩසටහනක් ලෙස හඳුන්වා දුන් අර්ධ රාජ්‍ය අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය, මෑතකදී නව නිෂ්පාදනයක් සහ ඉහළ වාරිකයක් සමඟ නැවත සැලසුම් කරන ලදී. අලෙවිකරණ දෙපාර්තමේන්තුව ආයතන 83ක් සාර්ථකව ආකර්ෂණය කරගෙන ඇති අතර දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා මෙම යෝජනා ක්‍රමය ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කරයි.කෙසේ වෙතත්, සහභාගීත්වය ස්වේච්ඡාවෙන් පවතින අතර, රාජ්‍ය බැංකු සහ අනෙකුත් රාජ්‍යය සතු ව්‍යවසායයන් වැනි සමහර ආයතන තමන්ගේම හෝ පෞද්ගලික රක්ෂණ විධිවිධානවලට (SOEs) කැමැත්තක් දක්වයි.	අග්‍රහාර අර්ධ රාජ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය වැඩි කිරීම සඳහා **ව්‍යාපාර පුළුල් කිරීමේ උපාය මාර්ගයක්** සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම නිර්දේශ කෙරේ.

3.2 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශ
මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයට අනුව, 2025 අප්‍රේල් 30 වන විට සේවකයින් 15 දෙනෙකුගේ හිඟයක් පැවතුනි.ඒ දිනය වන විට එය විධායක කළමනාකරණ තනතුරු පහකින් (5) සමන්විත වේ. සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුරු පිළිවෙලින් 2019 දෙසැම්බර් 16 සහ 2022 ජුනි 27 සිට වැඩබලන පදනම මත බඳවා ගන්නා ලදී. එබැවින්, සැලකිය යුතු කාලයක් තිස්සේ කළමනාකරණ තනතුරුවල පුරප්පාඩු පැවතීම මණ්ඩලයේ සුමට හා ඵලදායී ක්‍රියාකාරිත්වයට බලපාන බව නිරීක්ෂණය විය.	අද වන විට, මණ්ඩලයේ යාවත්කාලීන කරන ලද සේවක සංඛ්‍යා තත්ත්වය පෙන්නුම් කරන්නේ ප්‍රධාන පුරප්පාඩු තවමත් පුරවා නොමැති බවයි. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නිර්දේශ මත පදනම්ව, කලින් වැඩ තහනම් කරන ලද නිලධාරීන් විසින් ගොනු කරන ලද අධිකරණ නඩු හේතුවෙන් සහකාර සාමාන්‍යාධිකාරී-මූල්‍ය සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුරු අත්හිටුවා ඇත. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-රක්ෂණ සම්මුඛ පරීක්ෂණය 2025 ජුනි 19 වන දින පවත්වන ලදී. අවදානම් කළමනාකරු තනතුර සඳහා බඳවා ගැනීම් තවමත් සිදුවෙමින් පවතී. 2025 පෙබරවාරි 9 වන දින දැන්වීමෙන් පසු සුදුසු අපේක්ෂකයින් අයදුම් කර නොමැත.රජයේ වැටුප් පරිමාණයන් අඩු වීම සුදුසුකම් ලත් අයදුම්කරුවන් ආකර්ෂණය කර ගැනීමට බාධාවක් වී තිබේ. ඊට අමතරව, මැත කාලීන මැතිවරණ සමය MM ශ්‍රේණියට වඩා අඩු තනතුරු සඳහා බඳවා ගැනීම ප්‍රමාද කළේය.අවශ්‍ය අනුමැතිය ලැබුණු පසු ඉතිරි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කෙරේ.	විශේෂයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින් පවතින ප්‍රධාන කාර්ය මණ්ඩල හිඟය පියවා ගැනීම සඳහා මණ්ඩලය විසින් ක්‍රියාකාරී සහ ව්‍යුහගත මානව සම්පත් උපාය මාර්ගයක් අනුගමනය කළ යුතුය.